# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1971/13 - 2016 ජුනි මස 15 වැනි බදාදා - 2016.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද යටතේ වන නියෝග**

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමග කියවිය යුතු එහි 67 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිර්දේශ මත, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මවිසින් මෙහි පහත දක්වනු ලබන උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (ද්විත්ව විලි සහිත නලාකාර ප්‍රතිදීප්ත පහන් සහ ප්‍රතිදීප්ත පහන් සඳහා වන තුලබරු) නියෝග සාදනු ලැබේ.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2016 මැයි මස 31 වැනි දින.

*ඇමුණුම (අ)*

එල්.ඩී.බී 8/2007(II)

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමග කියවිය යුතු එහි 67 වැනි වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2016 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

1A - G 23651 — 08 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### නියෝග

1. මෙම නියෝග, 2016 අංක 1 දරන උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (ද්විත්ව විලි සහිත නලාකාර ප්‍රතිදීප්ත පහන් සහ ප්‍රතිදීප්ත පහන් සඳහා වන තුලබරු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තෙකු විසින් මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් අයිතමයක්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLS) අනුකූල වන්නේ නම් මිස ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම නොකළ යුතු ය.

3. මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් අයිතමයක් ආනයනය කරන හෝ නිෂ්පාදනය කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම-

(අ) මෙහි උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතය දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල බලශක්ති ලේබලයක්, එම අයිතමයට හෝ එම අයිතමය අසුරා ඇති කවරයට හෝ දවටනයට හෝ පෙට්ටියෙහි අලවා තැබිය යුතු ය. සහ

(ආ) අධිකාරිය විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී, එම ආනයනය කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන අයිතමය මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වන බවට සහතික කරමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

4. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් අයිතමයකට හෝ එය අඩංගු කවරයට හෝ දවටනයට හෝ පෙට්ටියට සවිකොට ඇති බලශක්ති ලේබලය, මෙම නියෝගවල 3(අ) වැනි නියෝග මගින් පනවා ඇති නියමයට අනුකූල නොවන්නේ නම් එවැනි අයිතමයක් ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

5. මෙහි නියෝගවල -

''පනත'' යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අදහස් වේ.

''අධිකාරිය'' යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ ; සහ

''ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය'' යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

### *උපලේඛනය*

*(2, 3 4 වැනි නියෝග)*

| අංකය | I වැනි තීරය | II වැනි තීරය |
|---|---|---|
| | අයිතිමය | SLS අංකය |
| 01 | නලාකාර ප්‍රතිදීප්ත පහන් | 1625:2012 |
| 02 | වොට් 18/20 ප්‍රතිදීප්ත පහන් සඳහා භාවිත කරනු ලබන චුම්භක තුලබරු | 1200:2012 |
| 03 | වොට් 36/40 ප්‍රතිදීප්ත පහන් සඳහා භාවිත කරනු ලබන චුම්භක තුලබරු | 1200:2012 |
| 04 | ප්‍රතිදීප්ත පහන් සඳහා භාවිතා කරනු ලබන ඉලෙක්ට්‍රොනික තුලබරු | 1200:2012 |

07-96

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.